# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 62 දරන
# සාත්තු නිවාස (පාලනය කිරීමේ)
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988, දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988, දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

**මිල : ශත 30 යි.** **තැපැල් ගාස්තුව : ශත 75 යි.**

# 1988 අංක 62 දරන සාත්තු නිවාස (පාලනය කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988, දෙසැම්බර් මස 17 වන දින.]

**එල්. ඩී.—ඕ. 58/87**

**සාත්තු නිවාස (පාලනය කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 62 දරන සාත්තු නිවාස (පාලනය කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාත්තු නිවාස (පාලනය කිරීමේ) පනතෙහි 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 120 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "රුපියල් එක් සියයක" යන වචන වෙනුවට "රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි "රුපියල් පණහක" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1987 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා, සලකනු ලැබිය යුතු ය. සංශෝධනය අතීතයට බලපෑම.

(2) 1987 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සාත්තු නිවාසයක් ලියාපදිංචි කරනු ලැබ හෝ සාත්තු නිවාසයක් සම්බන්ධයෙන් වූ ලියාපදිංචිය අලුත් කරනු ලැබ ඇති අවස්ථාවක, එම සාත්තු නිවාසයේ අයිතිකරු විසින්, මේ පනත ආරම්භ වී මාසයක් ඇතුළත —

(අ) මේ පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, එම ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම හෝ වෙනුවෙන්, අයිතිකරු විසින් ගෙවනු ලැබීමට නියමිත මුදල; සහ

(ආ) එම ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම හෝ වෙනුවෙන්, අවස්ථාවෝචිත පරිදි, එම අයිතිකරු විසින් ගෙවන ලද මුදල

අතර වෙනස, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ආරම්භ වූ දිනයෙහි සිට මාසයක් ඇතුළත, එම වෙනස ගෙවීමට සාත්තු නිවාසයක අයිතිකරු අපොහොසත් වීම, එම සාත්තු නිවාසයේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබීම සඳහා හේතුවක් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.